NORMAN WEERASOORIA MEMORIAL SHELTER

ICC




නෝමන් වීරසූරිය අනුස්මරණ නිවහන, 2019 සැප්තැම්බර් මස 26 වන දින ඉන්ටර්නැෂනල් කන්ස්ට්‍රක්ෂන් කොන්සෝටියම් පෞද්ගලික සමාගමේ ආරම්භක සභාපති නෝමන් වීරසූරිය මහතා අනුස්මරණය කරනු පිණිස ආරම්භ කොට පවත්වාගෙන යනු ලබන සමාජ සත්කාරයකි.

මෙමගින් මහරගම අපේක්ෂා රෝහලේ බාහිර රෝගී අංශයෙන් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට දුර බැහැර ප්‍රදේශවලින් පැමිණෙන අඩු ආදායම්ලාභී රෝගීන්ට සහ ඔවුන්ගේ භාරකරුවන් සඳහා නොමිලේ ආහාර පාන සහ නවාතැන් පහසුකම් සැපයීම අපගේ අරමුණයි.

මෙහිදී සෑම රෝගියෙක් සඳහාම රෝගීන් සඳහා විශේෂිත වූ ඇඳක්, නානකාමරයක්, භාරකරු සඳහා ඇඳක් සහ ආලින්දයකින් සමන්විත පෞද්ගලික කාමරයක් ලබා දෙනු ලැබෙයි. ඔවුන් සියලුම දෙනාට සෞඛ්‍ය ආරක්ෂිතව අපගේම මුළුතැන්ගෙයහි පිළියෙල කරන ලද නිර්මාංශ ආහාර වේල් තුනක් මෙන්ම උදෑසන සහ දහවල් තේ පැන් ද නොමිලේ සපයනු ලැබේ. තවද මෙම රෝගීන්ගේ මානසික සුවපත්භාවය සඳහා මෙම පරිශ්‍රය තුළ පුස්තකාලයක්, රූපවාහිනිය නැරඹීමට පහසුකම් සහ ඉහළම මාලයේ ආලින්දයේහි ආගමික වතාවත් සඳහා ද ඉඩපහසුව සලසා ඇත.

මෙම ආයතනය භාරකාර කමිටුවක් මගින් මෙහෙයවනු ලබන අතර මෙහි ජල විදුලි බිල්පත්, ආහාරපාන, කාර්ය මණ්ඩලයේ වැටුප් ඇතුළු සියලුම පරිපාලන පිරිවැය ඔබ වැනි පරිත්‍යාගශීලීන්ගේ වටිනා දායකත්වයෙන් ගොඩනැගෙන නෝමන් වීරසූරිය අනුස්මරණ නිවහන භාරකාර අරමුදල මගින්ම පවත්වාගෙනයාම අපගේ ඉලක්කයි. එබැවින්, මෙම නිවහනේ කටයුතු සාර්ථකව ඉදිරියට ගෙනයාම පිණිස ඔබගේ මූල්‍යමය දායකත්වය අප ස්තුතිපූර්වකව අපේක්ෂා කරමු.

ඔබගේ කාරුණික ආධාර, වියළි ආහාර සලාක (dry rations) ලෙසද නිවහනේ අවශ්‍යතාවය මත කළමනාකාරිත්වයෙන් විමසා ලබාදිය හැකි බව සලකන්න. අද ඔබගේ දායකත්වය ඉදිරි වසර ගණනාවක් තුළ බොහෝ දෙනෙකුගේ ජීවිත සුවපත් කරනු ඇත.

ඔබගේ මුල්‍යමය දායකත්වයන් පහත අපගේ බැංකු ගිණුමට බැරකරන්න

## පරිත්‍යාග ගිණුම් විස්තර

| | |
|---|---|
| බැංකුව | කොමර්ෂල් බෑන්ක් (පී.එල්.සී) |
| බැංකු ශාඛාව | විදේශ ශාඛාව. |
| බැංකු ශාඛා කේතය | 3 |
| බැංකු කේත අංකය | 7056 |
| බැංකු ලිපිනය | කොමර්ෂල් නිවස, අංක 21, සර්. රාසික් ෆරීඩ් මාවත, තැපැල් පෙට්ටිය 856, කොළඹ 01. |
| ස්විෆ්ට් කේතය (SWIFT CODE) | CEYLKLX |
| නේවාසික රෝගීන් හට දානය දීම පිණිස | ගිණුම් අංකය :- 1000417706 |
| නිවහනේ මෙහෙයුම් පවත්වාගෙන යාමේ අරමුදල පිණිස | ගිණුම් අංකය :- 1000150320 |
| විස්තරය/සටහන (Remarks) | කරුණාකර දායකයාගේ නම සහ දුරකථන අංකය සඳහන් කරන්න. |
| ගිණුම් ලිපිනය | අංක 70, එස්. ද එස්. ජයසිංහ මාවත, කොහුවල, නුගේගොඩ. |
| පුණ්‍ය ආයතනයේ නම | නෝමන් වීරසූරිය අනුස්මරණ නිවහන. |
| පුණ්‍ය ආයතනයේ ලිපිනය | අංක 73, අපේක්ෂා රෝහල් පාර, මහරගම. |

## රෝගීන් සඳහා දෛනික ආහාර පිරිවැය

| ආහාර වේල | මිල ගණන් (රුපියල්) |
|---|---|
| උදෑසන තේ සහ ආහාර වේල | 4,500/- |
| දහවල් තේ සහ ආහාර වේල | 4,500/- |
| සවස තේ සහ රාත්‍රී ආහාර වේල | 5,000/- |
| මුළු දෛනික පිරිවැය | 14,000/- |

අපව පහත සඳහන් අංකයෙන් පෙ.ව 9.00 - ප.ව 4.00 අතර සම්බන්ධ කරගත හැක.

+94 767673074

donation@nwms.lk